DOI: 10.31357/fhssmst.1999.00048

# ශ්‍රී ලංකාවේ දෙමළ පුවත්පත්වල ආරම්භය විකාශනය හා වර්ධනය

අංකය - MA/ HW/ 0026

ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලයේ ශාස්ත්‍රපති
ජන සන්නිවේදන උපාධිය සඳහා කෙරුණු
ස්වාධීන පර්යේෂණ නිබන්ධනයකි.

# ශ්‍රී ලංකාවේ දෙමළ පුවත් පත්වල ආරම්භය විකාශනය හා වර්ධනය


එන්. විජේරත්න

විභාග අංකය :- MA/ HW/ 0026


ශාස්ත්‍රපති ජනසන්නිවේදන උපාධිය

නිබන්ධක :- මහාචාර්ය තිස්ස කාරියවසම්

ජන සන්නිවේදනය :- ශාස්ත්‍රපති ජනසන්නිවේදන උපාධි පාඨමාලාව


සිංහල හා ජනසන්නිවේදන අධ්‍යායනාංශය

ජයවර්ධනපුර විශ්ව විද්‍යාලය


1999 - 05 - 23

# ශ්‍රී ලංකාවේ දෙමළ පුවත්පත්වල
# ආරම්භය විකාශනය හා වර්ධනය


එන්. විජේරත්න

විභාග අංකය :- MA/ HW/ 0026


ශාස්ත්‍රපති ජනසන්නිවේදන උපාධිය

නිබන්ධක :- මහාචාර්ය තිස්ස කාරියවසම්

ජන සන්නිවේදනය :- ශාස්ත්‍රපති ජනසන්නිවේදන උපාධි පාඨමාලාව


සිංහල හා ජනසන්නිවේදන අධ්‍යායනාංශය

ජයවර්ධනපුර විශ්ව විද්‍යාලය


1999 - 05 - 23

## පෙරවදන

ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලයේ ශාස්ත්‍රපති ජනසන්නිවේදන උපාධිය සම්පූර්ණ කිරීම සඳහා මෙම ශාස්ත්‍රීය පර්යේෂණ නිබන්ධනය කිරීම මාහට පැවරී තිබූ කාර්යකි. මෙම සත්කාරය සපුරාලීම සඳහා බොහෝ වෙහෙස මහන්සිවීම සිදුවීය. එනම් අවශ්‍ය පොත්පත් සොයා ගැනීම අසීරු කරුණක් විය. මේ සඳහා නොයෙක් දුක්–කම්කටොලුවලට මුහුණ දී මූලාශ්‍ර සොයා ගැනීමට කළ උත්සාහයේදීත් මෙය සම්පූර්ණ කිරී–මේදී උපදේශකත්වය ලබා දුන් අයත් බොහෝ වෙති. තවද මූලාශ්‍ර සොයා පුස්තකාල ගානේ දිනගණන් ඇවිදින්නට සිදුවිය. මූලාශ්‍ර ඇති ප්‍රදේශ වන යාපනය, මඩකලපුව, සිටි මිත්‍රයන් හමුවී නොයෙක් අවස්ථා වල සාකච්ඡා කළෙමි. දැනට අවුරුද්දකට ඉහත සිට මෙම කාර්යට අවතීර්ණ වී මූලාශ්‍ර පසුපස ඇවිද්දෙමි. එය ඉතා දුෂ්කර ගමනක් බව දැනුනි. එහෙත් උට්ඨාන වීර්යයත්, දෘඪ අපේක්ෂාවත් නිසා එහි සාර්ථක පල නෙලා ගැනීමට හැකිවිය.

මෙම පර්යේෂණ පිළිබඳ දෙමළ බසින් කර ඇති පර්යේෂණ කෘතියක් ලබා ගැනීමට කිපවිටක්ම දැනට තිතකුලේ පුවත්පතේ කර්තෘ ඒ. සිවනේශසෙල්වන් මහතා හමුවීමට ගියත් ඔහුගෙන් එම කෘතිය ලබා ගැනීමට නොහැකි විය. එම කෘතියේ අඩංගු කරුණු මොනවාද යන්න කියවා ගැනීමට නොහැකි විය. එම කෘතිය හැරුණු විට දෙමළ බසින් වෙනත් එවැනි කෘතියක් දක්නට නොලැබිණ.

මෙම පර්යේෂණය ආරම්භ කිරීමේදී අපගේ ගෞරවණීය ඇදුරු මහාචාර්ය තිස්ස කාරියවසම් මහතා පුන පුනා ඔයාට මේක කරන්න පුලුවන්ද ? යනුවෙනුත් අසන විට මා නොසැලී සිට අධිෂ්ඨාන පූර්වකව ඒ හැමවිට ''පුළුවන්'' යනුවෙන් උත්තර දුනිමි. ඒ අධිෂ්ඨානය නිසාම මෙය කර ගැනීමට හැකිවිය. මෙම අධ්‍යයනය කිරීමේදී නිතරම උපදෙස් දුන් අපගේ මහ ඇදුරු මහාචාර්ය තිස්ස කාරියවසම් ගුරුතුමා ඉතා ආදර–යෙන් කෘතඥතා පූර්වකව සිහිපත් කරමි.

''නොයෙක් පොතපත කියවන්න'' මේ පොත හොඳයි, මේ පොත අසවල් තැන තියෙනවා, යනුවෙන් මම හමුවූ හැමවිටම උපදෙස් දුන්නේ අපගේ ඇදුරු ආචාර්ය චන්දන කරුණානායක ගුරුතුමාය. එතුමාටත් කෘතඥතා පූර්වකව සිහිපත් කිරීමට ණයගැතිව ඇත්තෙමි.

මේ සත්කාර්ය කිරීමේදී නිතරම අප සමග කතා කරමින් මීට අවශ්‍ය පෝෂණය ලබා ගැනීමට මාර්ගෝපදේශකත්වය සැපයූ ජයවර්ධනපුර සරසවියේ සිංහල හා ජනසන්නිවේදන අංශයේ අංශාධිපති ආචාර්ය ධම්මික ගංගානාථ දිසානායක මහතාද මෙහිලා සිහිපත් කළ යුතුය.

ප්‍රථමයෙන් මෙම කාර්යයට උරදුන් යේ. යෝගනාදන් මිත්‍රයා නොසිටින්නට පර්යේෂණය අතරමග නවතින්නට ඉඩ තිබුණි. ඔහු විසින් යාපනයෙන් , මඩකලපුවෙන් , අවශ්‍ය ලිපි, අවශ්‍ය සියලුම දෑ සැපවූයේය. එයද මෙම නිබන්ධනය කිරීමට බොහෝ ප්‍රයෝජනවත් විය. ඔහුටද කෘතඥ වෙමි.

මෙම නිබන්ධනයට අවශ්‍ය අතිරේක පුවත්පත් කියවීමට මාර්ගය සලසා දුන් තිනකුරළ් පුවත්පතේ සහකාර කර්තෘත්වය හොබවන මහේන්ද්‍රරාජා රවිවර්මන්ද මහතාටද කෘතඥ වෙමි.

රාජ්‍ය ලේඛනාගාරයේදී ''සිංහලයෙන් පැරණි දෙමළ පුවත් සොයනවා'' යනුවෙන් ඉතා උනන්දුවෙන් පුවත්පත් සැපයූ සියලුම කාර්ය මණ්ඩලයට ස්තුතිවන්ත වෙමි. මෙහිලා සඳහන් කල යුතු පුවත්පත් ආරක්ෂක කුටියේ සේවය කරන සරත් කාරියවසම් මහතා ඉතාම ආදරයෙන් සිහිපත් කරන්නේ ඔහු විසින් අදාල සෑම පුවත්පතක්ම ළගට ගෙනවිත් ''මහත්මයා මේක හරිද'' යනුවෙන් අසා උදව් කළේය. ඔහුටද කෘතඥ වෙමි.

තවද කොළඹ දෙමළ සංගමයේ පුස්තකාලයේ සේවය කරනු ලබන සියලුම සේවකයන්ට මාගේ කෘතඥය හිමි. මේ අයුරින්ම කොළඹ හින්දු සංස්කෘතික කටයුතු අමාත්‍යාංශයෙහි අධ්‍යක්ෂක ඇතුලු සියලුදෙනා සිහිපත් කරමි.

රාජ්‍ය ලේඛනාගාරයේදී හමුවූ එලගන්වත්තේ චන්ද්‍රසිරි හිමියන් ''විජේ අයියේ'' අසවල් එක්කෙනාට කියන්න, එතකොට පත්තරය දෙයි. යනුවෙන් ඒ සියලුදෙනාම අඳුන්වා දී උන්වහන්සේ උදව් කළේය. උන්වහන්සේට දහසක් පිං.

මෙම කාර්ය කිරීමේදී නිතරම රාජ්‍ය ලේඛනාගාරයට යාමට සිදුවන අවස්ථාවලදී ඒ සඳහා උදව් කළ අප කාර්යාලයේ ශාන්ති ජයසුන්දර සොයුරියටද කෘතඥ වෙමි. තවද ඒ අසල සිටින සියලුම කාර්ය මණ්ඩලය ''අද බොස්''නොහේදෝ යනවා කිව්වා නේද ? යන්නෙ නැද්ද ? ගිහින් වැඩේ කරගන්න යනුවෙන් උනන්දු කළ කමලානි ජයනෙත්ති, ආනන්ද විතාන ( බණ්ඩාර ) යන අයව සිහිපත් කරමි.

මෙම මහගු කාර්යයේදී ඉතාමත්ම වැදගත්ම කොටස ඉටුවූයේ අපගේ ආදරණීය ලොකු නංගී වන රසිකා දිල්හානි රණවීර ගෙනිය. ඇය නොසිටින්න මෙය පොතක් වශයෙන් නිර්මාණය නොවනු ඇත. ඇයටද දහස් වරක් ස්තූතිය හා ගෞරවය පුද කරමු.

මෙහි දෙමළ ටයිප්සෙටිං කර දුන් ''රමේෂ්'' මහතාටද ස්තූතිවන්ත වෙමි.

අවසාන වශයෙන් මෙම කාර්ය කිරීමේදී බොහෝ දේවල් ඉවසාගෙන සැමවිට ඉන්ද්‍රඛීලයක් සේ නොසැලී මා ළඟින් සිටින මා ආදරණීය බිරිඳ ''හේමමාලි ආනන්දිකා'' ඉතාම ගෞරවයෙන් යුතුව සිහිපත් කරමි.

තක්ෂිලාව,
411/4 ,
ඉහල කොස්ගම ,
කොස්ගම.

මෙයට ,
එම් . විජේරත්න.

## පටුන


| | පිටුව |
|---|---|
| පෙරවදන | 1 – 111 |
| සංඛ්‍යා සටහන් පටුන | 1V– V |
| රූප සටහන් පටුන | V1– |
| පරිච්ඡේදය | |
| 1. හැඳින්වීම. | 1 – 2 |
| 1.1 අධ්‍යයනයේ පරමාර්ථ | 3 – 4 |
| 1.2 අධ්‍යයනයේ සැලැස්ම | 4 – 5 |
| 1.3 අධ්‍යයනයේ සීමා | 5 – 6 |
| 2. දේශීය පුවත්පත් කලාවේ ආරම්භය ( දෙමළ පුවත්පත් වලට විශේෂිතව ) | 7 |
| 2.1 පිවිසුම | 7 – 8 |
| 2.2 පෘතුගීසීන්ගේ සමයේ ලංකාව | 8 |
| 2.3 ලන්දේසීන්ගේ සමයේ ලංකාවේ ප්‍රතිසංස්කරණ හා වෙනස්කම් | 8 |
| 2.4 ඉංග්‍රීසි පාලන සමයේ ඇතිවූ වෙනස්කම් | 9 |
| 2.5 කෝල්බෲක් කැමරන් ප්‍රතිසංස්කරණය | 9 – 10 |
| 2.5.1 ශෙස්ත්‍රිය කටයුතු | 10–13 |
| 2.6 යටත්විජිත සමයේ යාපනයේ සමාජ, ආර්ථික, දේශපාලන, ස්වභාවය | 13–14 |
| 2.7 මුද්‍රණ කර්මාන්තය ඇරඹීම | 14–15 |
| 2.8 ශ්‍රී ලංකාවේ මුල්ම පුවත්පත් ( දෙමළ පුවත්පත් හැර ) | 15–18 |
| 3. දෙමළ පුවත්පත් වල ආරම්භය හා විකාශනය ( ඉන්දියාව ) | 19– |
| 3.1 දෙමළ පුවත්පත් බිහිවීමට තුඩුදුන් ඓතිහාසික පසුබිම | 19–20 |
| 3.2 ඉන්දියාවේ මුද්‍රණ කර්මාන්තය | 20–21 |
| 3.3 තමිල්නාඩු ප්‍රාන්තයේ පුවත්පත් ආරම්භ වූ වගයි | 21–22 |
| 3.4 ඉංග්‍රීසි නමින් ''හින්දු'' පුවත්පතක් ආරම්භ වෙයි. | 24–26 |
| 3.5 මුල්ම දෙමළ පුවත්පත් හා තවත් පුවත්පත් | 26 –29 |

| | පිටුව |
|---|---|
| 3.56 ඉන්දියාවේ ජාතික සටනට උරදීමට පුවත්පත් සැරසෙයි | 29 – 31 |
| 3.7 ස්වදේශ මිත්තිරන් ( 1882 – 1980 ) | 31 – 33 |
| 3.8 විවේකචින්තාමණි ( 1892 – 1920 ) | 33 – 36 |
| 3.9 ලෝකෝපකාරි ( 1895 – 1949 ) | 36 – 38 |
| 3.10 ශ්‍රී ලංකාවේ දෙමල පුවත්පත් වල ආරම්භය හා වර්ධනය | 38 – 39 |
| 3.11 ශ්‍රී ලංකාවේ ප්‍රථම පුවත්පත ඇරඹෙයි | 40 – 41 |
| 3.12 ශ්‍රී ලංකාවේ 1841 සිට ඇරඹුනු පුවත්පත් | 41 – 65 |
| 4. දෙමළ පුවත්පත් වල ව්‍යාප්තියට බලපෑ සමාජ, ආර්ථික, දේශපාලනික හා සංස්කෘතික සාධක | 65 – 71 |
| 4.1 ආරුමුගනාවලර් විසින් ආරම්භ කරන ලද සංස්කෘතික ප්‍රබෝධය පුවත්පත් කෙරෙහි බලපෑ ආකාරය | 71 – 73 |
| 4.2 මුද්‍රණාල පිහිටුවීමට දුෂ්කර ගමනක් කරා | 73 – 75 |
| 4.3 නාවලර් පුවත්පත් දායකත්වය | 75 – 81 |
| 4.4 ඉස්ලාමීය ජාතික සිත්තිලෙබ්බේ පඩිවරයාගෙන් දෙමළ පුවත්පත් උදෙසා සිදුවූ සේවාව | 81 – |
| 4.5 මුස්ලිම් නේසන් පුවත්පත ඇරඹෙයි | 81 – 83 |
| 5. දෙමළ පුවත්පත් වල අන්තර්ගතය | 83 – 85 |
| 5.1 තේමා පාඨය | 85 – |
| 5.2 සාමාන්‍ය පුවත් | 85 – 94 |
| 5.3 ආර්ථික පුවත් හා වෙළඳ දැන්වීම් | 94 – 97 |
| 5.4 කතුවැකි | 97 – 101 |
| 6. සාරාංශය, නිගමනය, නිර්දේශය | 102 – |
| 6.1 සාරාංශය | 102 – 104 |
| 6.2 නිගමනය | 105 – 106 |
| 6.3 නිර්දේශය | 106 – 107 |
| ආශ්‍රිත ග්‍රන්ථ | 108 – 114 |
| උපග්‍රන්ථ | 115 – 120 |

<u>රූප සටහන් පටුන</u>


| | පිටුව |
|---|---|
| 1. ශිවදේශ මිත්තිරන් | 30 |
| 2. විවේකචින්තාමණි | 32 |
| 3. ලෝකෝපකාරී | 35 |
| 4. උදයතාරකෙයි ( 1872 ජනවාරි 4 වෙනි දින කලාපයේ මුල් පිටුවයි ) | 39 |
| 5. පාලියර් නේසන් ( 1865 ජනවාරි කලාපයේ මුල් පිටුවයි ) | 43 |
| 6. පුදිනාධිපති ( 1870 මාර්තු 19 වෙනි දිනන කලාපයයි ) | 46 |
| 7. පුදිනාලංකාරී ( 1873 ජූනි 7 වෙනි දින කලාපයයි ) | 48 |
| 8. මුස්ලිම් නේසන් ( 1888 පෙබරවාරි කලාපයයි) | 53 |
| 9. ඉලංගෙයි නිනවර්තමානී ( 1886 මාර්තු කලාපයයි ) | 58 |
| 10. ශ්‍රීල.ශ්‍රී. ආරුමුගනාවලර් තුමා ( 1822 – 1879 ) | 70 |
| 11. යාපනයේ නාවලර් විදිය | 72 |
| 12. නාවලර්ගේ විද්‍යානුපාලන මුද්‍රණාලය | 74 |
| 13. නාවලර්ගේ වෛන්නෙයි වල පිහිටි විද්‍යානුපාලන මුද්‍රණාලය | 76 |
| 14. යාපනයේ ආණ්ඩුවේ දිසාපති ඩියුක් | 78 |
| 15. සි. එම්. සිත්තිලෙබ්බෙ මහතා ( 1838 – 1898 ) | 80 |

## 1. හැඳින්වීම .

ශ්‍රී ලංකාවේ දෙමළ පුවත්පත් වල ආරම්භය, විකාශනය, වර්ධනය, පිළිබඳ අධ්‍යයනය කිරීමක් මෙම නිබන්ධනයෙන් සිදුකෙරේ. ශ්‍රී ලංකාවේ අනාදිමත් ඉතිහාසයක් දෙමළ ජනතාවටද ඇත. එමනිසා දෙමළ පුවත්පත් වලටද දිගු ඉතිහාසයක් ඇති මේ පිළිබඳ අධ්‍යයනය කිරීමෙන් ඒ බව පසක් කරගත හැක. ශත වර්ෂ එකහමාරකට ආසන්න ඉතිහාසයක් අප රටේ දෙමළ පුවත්පත් වලට තිබෙන බව අධ්‍යනය තුළින් අවබෝධ වේ.

රාජාණ්ඩුසමයේ සිට යටත්විජිතවාදි පාලන කාලය තෙක් මේ රටේ දෙමළ ප්‍රදේශ මහා ආණ්ඩුවට යටත්ව පාලනයක් තිබූ බව ඉතිහාස මූලාශ්‍ර පෙන්වා දෙයි. මේ නිසා මෙරටෙහි දෙමළ සංස්කෘතියක් දෙමළ භාෂාවක් වරින් වර පැවැති රාජාණ්ඩු වලට හා යටත්විජිතවාදී සමයේදී මෙරටේ සංස්කෘතිය, සභ්‍යත්වය, භාෂාව හා ආගම පිරිහී ගිය බව කාටත් නොරහසකි. මේ අයුරින්ම දෙමළ ප්‍රදේශ වල ඔවුන්ගේ සංස්කෘතිය, සභ්‍යත්වය, ආගම යන අංශයන් පිරිහී ගියේය. මේ තත්ත්වය වරින්වර ඇඳවැටෙමින්ද නැවතත් නැගිටිමින්ද පැවතුණි. එහෙත් මෙරටෙහි ඉංග්‍රීසීන්ගේ සමයෙහි ස්වදේශික සංස්කෘතිකය, සභ්‍යත්වය, ආගම, භාෂාව, ගරා වැටීමෙන් පැවතුනත් එම සමාජයෙන්ම පැන නැගුණ සමාජ සෝදකයන් නටබුන් වී ගිය සමාජය යළි පිළිසකර කර නැවතත් ආලෝකයක් දීමට උත්සාහ ගත්තෝය.

විශේෂයෙන් මෙරට ඉංග්‍රීසීන්ට යටත් විජිතයක්ව පැවති සමයේ මෙවැනි බිඳ වැටීම් සහ නැවත නැගී සිටීම ඇතිවී ඇතිබව පෙනේ. මේ සමයෙහි සමාජය විවරණය කරනු ලබන ඉතිහාස මූලාශ්‍ර පෙන්වා දෙන්නේ එකල සමාජයට දැඩිව නිතු දහම ප්‍රචාරය කරවා සමස්ථ සමාජ ප්‍රපංචයම එම ආගමට නතුකර ගැනීමට යත්න දැරූ බවයි. ආගම් ප්‍රචාරය කිරීමේ අතුරුඵලය වූයේ පුවත්පත් බිහිවීමයි.

මෙරටෙහි සිංහල සමාජය හෝ වේවා දෙමළ සමාජය හෝ වේවා මෙම ආගම් ප්‍රචාරක ග්‍රහණයට දැඩි ලෙස හසුවූ නිසා මෙරට සමාජය කියවීමට ලිවීමට හුරු විය. ඒ නිසාම අධ්‍යාපනය දියුණු විය. අධ්‍යාපනය දියුණු වීම මෙරට පුවත්පත් වර්ධනය කෙරෙහි තදින්ම බලපෑවේය.

සමාජය වෙස්වීමත් සමගම වැවසම් ක්‍රමය වෙනුවට නූතන ප්‍රජාතන්ත්‍රවාදී සමාජයක් බිහිවිය. මේ නිසාම ඉංග්‍රීසි උගත් සමාජයක් ඇතිවිය. ඒ නිසාම අප රටේ මුලින්ම බිහි වන්නේ ඉංග්‍රීසි පුවත්පතකි. ඉන් අනතුරුව ස්වදේශික භාෂාවක් වන දෙමළ භාෂාවෙනුත්, සිංහල භාෂාවෙනුත්, පුවත්පත් ඇතිවෙයි. දෙමළ පුවත්පතක් මුලින්ම 1841 දී ඇතිවෙයි. එදා සිට අද දක්වා දෙමළ පුවත්පත් වලට සියවස් එකහමාරක් පමණ කාලයක ඉතිහාසයක් ඇත. මේ නිසා මෙවන් ප්‍රවාඩ අභිමානවත් ඉතිහාසයකට හිමිකම් කියන පුවත්පත් කලාවක් ගැන සිංහලයෙන් කරුණු සෙවීම යුක්ති යුක්තය.

මෙම අධ්‍යයනය සම්පූර්ණ කෙරෙනු වස් දෙමළයේ සියලුම පුවත්පත් වලට ඉන්දියාව ඇතුලත්වීම පුවිශේෂය. මන්දයත් දකුණු ඉන්දියවේ දෙමළ ජනතාව කෝටි 71/2 ක් පමණ වෙයෙන බැවින් ඔවුන් සතු දෙමළ පුවත්පත් කලාව මෙහිලා සටහන් කිරීම වැදගත් නිසාය. එම නිසාම දකුණු ඉන්දියානු දෙමළ පුවත්පත් වර්ධනය එක් පරිච්ඡේදයක කොටසක් හැටියට මෙහිලා සඳහන් කළෙමි.

ශ්‍රී ලංකාවේ දෙමළ පුවත්පත් ඉතිහාසය 1841 ආරම්භ වේ. එය අද දක්වාම නොනැසී නොබිඳී ඉතා වර්ධනීය අවස්ථාවකට අද දක්වා ගමන් කර ඇත. මෙම නිබන්ධනයෙන් සිදු කෙරෙනුයේ 1900 තෙක් බිහිවුනු සියලුම පුවත්පත් ගැන කරුණු සොයා බැලීමය. තවද එම පුවත්පත බිහිවීමට තුඩුදුන් සංස්කෘතික, ආගමික, ආර්ථික, දේශපාලනික, පසුබිම මෙහි තවත් පරිච්ඡේදයකින් සාකච්ඡා කෙරේ. මෙම පරිච්ඡේදයෙන් අනතුරුව එකල බිහිවූ පුවත්පත් වල අන්තර්ගතය සාකච්ඡා කෙරුණි. මූලික වශයෙන් එම පුවත්පත් වල අරමුණු සාමාන්‍ය ප්‍රවෘත්ති, ආර්ථික වටිනාකමකින් යුත් ප්‍රවෘත්ති සහ වෙළඳ දැන්වීම්, ඇතුලු සියලුම කරුණු ගැන අධ්‍යනයක් කරන්නට යෙදුනි.

මීට අමතරව නොයෙක් බාධක දුෂ්කම්කටොලු මධ්‍යයේ මෙම නිබන්ධනය සිදු කිරීමට හේතු වූයේ අවශ්‍ය මූලාශ්‍ර සොයා ගැනීමට තිබූ අපහසුතාවයයි. කෙසේ වෙතත් ඉතා අධිෂ්ඨාන පූර්වකව මෙම කරුණු සොයා ගෙන මෙම අධ්‍යයනය කරන්නට යෙදුනි.

1.1 අධ්‍යයනයේ පරමාර්ථ .

ශ්‍රී ලංකාවේ ප්‍රධාන වශයෙන් ඇත්තේ භාෂා දෙකකි. තුන්වන භාෂාව වන ඉංග්‍රීසිද මෙහි වැඩි වශයෙන් භාවිතා කරනු ලබති.

ඉංග්‍රීසියත්, දෙමළත්, අතර පරතරයත් එතරම් දක්නට නොලැබෙන අතර සිංහලත්, ඉංග්‍රීසි අතර පරතරයක්ද එතරම් දක්නට නොලැබේ. නමුත් සිංහලත්, දෙමළත්, අතර ඇති පරතරය ඉතා විශාලය. මේ භාෂා දෙක එකිනෙකට හඳුනා ගැනීමට මෙරට ස්වදේශික සිංහලයන්ගෙන් බහුතරයක් හෝ දෙමළ ජනයාගෙන් බහුතරයක් අකැමති වෙති. ඒ කුමන හේතුවක් නිසාදැයි කීමට නොහැක. මෙම භාෂා දෙක අතර ඇති පරතරය අවම කර ගතහොත් ඔවුන් එකිනෙකා අතර අන්‍යෝන්‍ය අවබෝධය ඇතිවනවාට කිසිදු සැකයක් නැත. මෙවන් පරතරයක් නිසාම අද වාර්ගික ප්‍රශ්නය ඉතා උග්‍ර ලෙස පැන නැගී ඇති බව මගේ විශ්වාසයයි.

මෙරටේම ජීවමාන භාෂාවක හා ජාතියක සංස්කෘතික ලක්ෂණ එකිනෙකා හඳුනා ගැනීමට උත්සාහ දැරිය හැක්කේ ඔවුනොවුන්ගේ ආර්ථික , සාමාජික, දේශපාලනික, ආගමික, කරුණු ඉගෙන ගැනීම තුලිනි. මෙම කරුණු ඉගෙනීමට නම් සාහිත්‍ය මුල් කරගත හැක. පුවත්පත් වලටද යම්කිසි කාර්යභාරයක් සාහිත්‍ය උදෙසා කල හැක. එදා සමාජයේ කුමන ආකාරයකට යටත් කරුණු විසිරී තිබුණාද යන්න පුවත්පත් තුලින් හෙළිදරව් වේ. මෙසේ විවරණාත්මකව හෙළිදරව් කරදී ඇති කරුණු වර්තමාන හා අනාගත පරපුර වෙත හඳුන්වා දීම මෙම නිබන්ධනයේ එක් පරමාර්ථයකි.

තවත් පරමාර්ථයක් වනුයේ මේ මගින් මෙම අධ්‍යයනය තුලින් දෙමළ පුවත්පත් වල ක්‍රියාකාරීත්වය කෙබඳු අයුරකින් වැඩි ගියේද යන්න සිංහල ජනතාව වෙත අවබෝධයක් ඇතිකරලීමද වේ. තවද එකල දෙමළ ජනසමාජය දේශපාලනික වශයෙන් හෝ ආගමික වශයෙන් නොයෙක් ගැටලු වලට මුහුණ පා ඇත. ඒවා සිංහලයන් මුහුණ දුන් ගැටලු සමග සසඳා ගැනීමටද මෙම නිබන්ධනය ඉවහල් වේ. මේ අයුරින්ම මෙතෙක් දෙමළ පුවත්පත් පිළිබඳව සිංහලයෙන් හෝ දෙමළ බසින් හරි හැටි විවරණාත්මක අධ්‍යයනයක් නොමැතිකම පිරිමසාලීම තවත් පරමාර්ථයකි.

මේ නිසා ඉහතින් සඳහන් කල සියලුම පරමාර්ථ සපුරා ගැනීමට යම්තාක් දුරකට මෙම නිබන්ධනය ඉවහල් වේ යැයි මගේ විශ්වාසයයි.

## 1.2 අධ්‍යයනයේ සැලැස්ම .

මෙම අධ්‍යයනයේ මූලික සැලැස්ම තීරණය වූයේ අධ්‍යයනය කිරීමට ලැබී ඇති කාල පරාසය අනුවයි. මාස දෙකක් තරම් පූර්ව කාල පරිච්ඡේදයක් තුල නොයෙක් වැඩ කටයුතු මධ්‍යයේ අධ්‍යයනය කිරීමට ඇති තොටය ඉතා දීර්-ඝය. එනම් ශ්‍රී ලංකාවේ දෙමළ පුවත්පත් ආරම්භ වූ කාලවකවානුවේ සිට ( වර්ෂ 1841 සිට 1900 තෙක් ) දශක 6 ක අවසියවයකට වඩා වැඩි කාලච්ඡේදයක අධ්‍යයනයක් පූර්වෙන් කළ නොහැක. මේ සඳහා ලැබී ඇති කාලය අනුව පරීක්ෂා කළ හැකි ලබාගත හැකි දත්ත ප්‍රමාණය අනුව දශක 6 ක කාල පරාසයක පුවත් පත් වර්ධනය අධ්‍යයනයට භාජනය කෙරිණ. මේ අනුව අධ්‍යයනය සිදුකෙරිණ.

මේ අනුව මෙම නිබන්ධනය පරිච්ඡේද 6 කින් සමන්විත වීය. එක් එක් පරිච්ඡේද අනු ඡේද ගණනාවකට බෙදා ඇත. මෙහිලා උදාහරණයක් ලෙසියට දෙවන පරිච්ඡේදය ගනිමු. මෙහි ප්‍රධාන මාතෘකාව වූයේ ''දේශීය පුවත්පත් කලාවේ ආරම්භය '' (දෙමළ පුවත්පත් වලට විශේෂිතව) යන්නයි. මෙය උපමාතෘකා අටකට බෙදා අධ්‍යයනය කරන ලදී. එනම් මෙහි පළමුවැන්න පිවිසුමය, ඉන් අනතු-රුව පෘතුගීසීන්ගේ සමයේ ලංකාව අධ්‍යයනය කරන ලදී. ඊටපසු ඊළග යටත්විජිත වාදීන් වන ලන්දේසි හා ඉංග්‍රීසි ගැනද අධ්‍යයනය යෙදුනෙමි.

මෙහි පස්වෙනි අවස්ථාව හැටියට කෝල්බෲක් කැමරන් ප්‍රතිසංස්-කරණ අධ්‍යයනය කරන ලදී. මෙය අධ්‍යයනය කරන ලද්දේ මෙම රටෙහි මූලික වෙනස්කම් ඇති වූයේ මෙම ප්‍රතිසංස්කරණ වලින් පසුව වූ නිසාය. මෙම අධ්‍ය-යනයෙන් පසු ''යටත්විජිත සමයේ යාපනයේ සමාජ, ආර්ථික, දේශපාලනික, ස්වභාවය අධ්‍යයනයක යෙදුනි. මන්ද දෙමළ පුවත්පත් වලට අතීතාලම වැටෙන්නේ යාපනය ප්‍රදේශය මුල් කරගෙන නිසාය.

ඊළඟ අනු පරිච්ඡේදය වශයෙන් මුද්‍රණ කර්මාන්තය ඇරඹීම යොදා ගන්නා ලදී. පුවත් පත් වර්ධනය සෘජුවට බලපෑ එක් හේතුවක් මුද්‍රණ කර්මාන්තය නිසා මේ පිළිබඳ අධ්‍යයනයක් කරන ලදී. පරිච්ඡේදයේ අවසානය වූයේ ශ්‍රී ලංකාවේ මුල්ම පුවත්පත් (දෙමළ පුවත්පත් හැර) යන මාතෘකාව අධ්‍යයනය කරන ලදී.

දෙවන පරිච්ඡේදය වූයේ දෙමළ පුවත්පත් වල ආරම්භය හා විකාශනය යන්නයි. මෙයද අනු ඡේද 8 කට බෙදා අධ්‍යයනය කරන ලදී. මේවා පිළිබඳ අධ්‍යයනය සැලසුම් කරන ලද්දේ පටුනේ අනුපිළිවෙලටය. තුන්වන පරිච්ඡේදයට හිමි වූයේ දෙමළ පුවත්පත් වල ව්‍යාප්තියට බලපෑ සමාජ, ආර්ථික, දේශපාලනික, හා සංස්කෘතික සාධක අධ්‍යයනය කිරීමය. මෙයද පටුනේ අනුපිළිවෙලට අධ්‍යයනයට යෙදුන බව කිව යුතුය.

මෙහි පස්වන පරිච්ඡේදය වූයේ දෙමළ පුවත්පත් වල අන්තර්ගතය පිළිබඳ අධ්‍යයනයක් යන්නයි. එයද පටුනේ දක්වා ඇති අයුරින් කිපයකට බෙදා අධ්‍යයනය කරන ලදී.

අවසාන පරිච්ඡේදය වූයේ නිගමනය හා නිර්දේශය, මෙයට සාරාංශයද ඇතුලත් කරන ලදී.

මෙය අධ්‍යයනය කිරීමට නියමිත කාල සටහනක්ද යොදා ගත් බැවින් මෙම අධ්‍යයනය සැලසුම් කළ අයුරින් නිමා කර ගැනීමට හැකිවිය.

1. 3 අධ්‍යයනයේ සීමා .

ශ්‍රී ලංකාවේ දෙමළ පුවත්පත් වල ආරම්භය, විකාශනය කිව්වාම ඉතා දීර්ඝ කාල පරිච්ඡේදයක අධ්‍යයනයකි. එනම් මෙරටේ ශත වර්ෂ 11/2 කට අධික අවුරුදු ගණනක් හිමිකම් කියන දෙමළ පුවත්පත් කලාවක් ඇත. එබඳු සියවස් 11/2 ක ඉතිහාසය අධ්‍යයනය කිරීම ඉතාම අසීරු කටයුත්තකි. ශාස්ත්‍රපති පරීක්ෂණය සඳහා ලැබී ඇති කාලය ගත්විට මෙබඳු කාර්යයක් කිරීමට කාලය ප්‍රමාණවත් නොවන බව කිව යුතුය. එමනිසා මෙම කාලපරාස තුල කළ හැකි සීමාවක්

තෝරා ගතතේමු. ඒ අනුව මෙම අධ්‍යයනයට සීමා වී ඇත්තේ දශක 6 ක් පමණ කාලයක මෙරටේ වර්ධනය වූ දෙමළ පුවත්පත් වල ඉතිහාසයයි. ඉන් ඔබ්බටද මෙරටේ දෙමළ පුවත්පත් ඉතිහාසයක් ඇත. එහි කාලච්ඡේදවලද වැදගත් සන්ධිස්ථාන ගණනාවකට බෙදා වෙන්කල හැක. මේවා මතු අධ්‍යයනය-කදී නිබන්ධනයක් කිරීම වටනේය. ඒ අනුව මෙම අධ්‍යයනයේ සීමාව වන්නේ දෙමළ පුවත්පත් වල ආරම්භයේ සිට එනම් 1841 සිට 1900 තෙක් පළ වූ පුවත්පත්ය.